

DS

# 3 ද්වාරය

පොදු ව්‍යවහාරයේ දී ඡායාරූපයක් ගැනීම යනු කැමරාවක ද්වාරය ක්‍රියාත්මක කිරීමේ බොත්තම (Shutter Releasing button)ඔබා ද්වාරය ක්‍රියාත්මක කිරීමයි. සැබැවින් ම මේ මොහොත ඡායාරූපය සටහන් වන අවස්ථාවයි. කාචය හැරුණු විට කැමරාවක වැදගත් ම කොටස ද්වාරය වන අතර එය ක්‍රියාත්මක කරන මොහොත ඡායාරූපයේ සාර්ථකත්වයට බෙහෙවින් ම බලපාන්නේය. ද්වාරය විවෘත කර ඡායාරූපය සටහන් කර ගන්නා විට ආලෝක ප්‍රමාණයට ද චලනයට ද බලපෑම් ඇති වන්නේය. ඡායාරූප ගැනීමේ කාර්යය සාර්ථක කර ගැනීමට දත යුතු කරුණු අතර ද්වාරය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ කරුණු මුල් තැනක් ගනී.

නමින් ම හැදින්වෙන පරිදි එය දොරකි. ඡායාරූප ගන්නා විට ඇරී වැසෙන දොරකි. අවශ්‍ය කාලයට වඩා වැඩි කාලයක් දොර ඇරී තිබුණහොත්, වැඩියෙන් එළිය ලැබීමෙන් හෝ කැමරාව සෙලවීමෙන් හෝ වස්තුව සෙලවීමෙන් හෝ ඡායාරූපය අසාර්ථක වේ. විවෘතව පවතින කාලය අඩුවීමෙන් ද ඡායාරූපය අසාර්ථක වේ. මුල් අවස්ථාවක සඳහන් කළ පරිදි ආලෝක පාලනය ද්වාරයෙන් මෙන් ම විවරයෙන් ද (4 වන පරිච්ඡේදය) කළ හැකිය.